
# තීර්ථ

news.slpa.lk/theertha ISSN: 2448-9948

පළමුවන කාණ්ඩය 03 වන කලාපය 2021



## “කොළඹ වරාය සතු විභවයන් හා ශක්‍යතාවයන් මැනවින් දැන හැඳින කටයුතු කිරීමට නිරන්තරයෙන් කැපවෙමු”

වරාය හා නාවික ගරු අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන

## කොළඹ වරායේ මෙහෙයුම් ධාරිතාවය ඉහළට

## ලෝකයේ විශාලතම බහලු නෞකාව කොළඹ වරායට

# ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක වැටුප් විෂමතා විසඳෙයි



මේ රටට විදේශ විනිමය උපරිමයෙන් ලබා දීම

# අපගේ අභිලාෂයයි

**විනීන්ද්‍ර වීරමන්** - සභාපති - ශ්‍රී ලංකා නැව් සංස්ථාව

"සිලෝන් ටී" නාමය සමස්ත ලෝකයම හඳුනාගන්නා සේම ලෝක වාණිජ ක්ෂේත්‍රයේ "සිලෝන් ෂිපින්" යන නාමය ද අතිශයින් ප්‍රචලිත ය. ලොව පුරා විසිරී සිටින විජ්ජන ජාලයක් සහිත ලංකා නැව් සංස්ථා සන්නාමය ආර්ථික සංඛ්‍යා ලේඛණ මගින් මැනිය හැකි සේම මැනිය නොහැකි සේවාවන් රැසක් ද මෙරටට දායාද කරමින් සිටියි. සිය පනස් වසරක සාඩම්බර අභිමානය සමරනු ලබූ ලංකා නැව් සංස්ථාවේ ඉදිරි දැක්ම පිළිබඳ එහි සභාපති හිරිඟ විනීන්ද්‍ර වීරමන් මහතා සමග සිදු කළ සංලාපයයි මේ.

සංලාපය - උපුල් ගුරුගේ

ඡායාරූප - මහින්ද තෙන්නකෝන්

**මුලින්ම අපි පවතින කොවිඩ් අර්බුදය හමුවේ දේශීය ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට සකසා ඇති දහසය වැදෑරුම් (16) පිළිවෙත් පිළිබඳ කතා කරමු..?**

ඔව්, ලංකා නැව් සංස්ථාව සතු පනස් වසරක සාඩම්බර අභිමානය පෙරට ගෙනයාමේ අරමුණෙන් තිරසාර දැක්මක් යටතේ මෙම 16 වැදෑරුම් පිළිවෙත් ඔස්සේ ජයග්‍රහණය කරා ගමන් කරනවා. ඒ යටතේ,

සාම්ප්‍රදායික වාණිජ නාවික ක්ෂේත්‍රයේ කටයුතු පුළුල් කිරීම, රජයේ ප්‍රවාහන භූමිකාව තවදුරටත් අත්පත් කරගැනීම, වෙනත් රාජ්‍ය යාන්ත්‍රණ සමග ඒකාබද්ධ යාන්ත්‍රණයක් ලෙස කටයුතු කිරීම, රජය ප්‍රතිපත්තීන්ට අනුකූල වෙමින් පුද්ගලික අංශ සමග ඒකාබද්ධ වීම, විදේශ විනිමය ඉපැයීම සහ තොග ප්‍රවාහන ගාස්තු ලෙසින් රටින් බැහැරව යන විනිමය ඉතිරි කිරීම, නෛතික පුළුල්භාවයක් අත්පත් කරගනිමින් අනුසාංගික ආයතන ගණනක් බිහි කිරීම, එමගින් නව අවස්ථා සඳහා අධි සුපරීක්ෂක සහ කාර්යක්ෂම යාන්ත්‍රණයක් ඇති කිරීම, පර්යේෂණ දත්ත විශ්ලේෂණය සඳහා නව යාන්ත්‍රණයක් ඇති කිරීම, නවීන දත්ත සම්ප්‍රේෂණයේ වාණිජ පදනම පුළුල් කරගැනීම, ඩිජිටල් තලයේ භාවිතාව ශක්තිමත් කරගැනීම, නෞකා බලඝණ වර්ධනය, නව උපකරණ සහ භූමි අත්පත් කරගැනීම තුළින් භෞතික සම්පත් කඩිනම් වාණිජ ප්‍රතිඵල ජනනය වන ආකාරයෙන් වර්ධනය කරගැනීම හා පුහුණු ශ්‍රමික බලය වර්ධනය කරගැනීම, නාවික ආපදා සඳහා මැදිහත්වීම ව්‍යාපාරික අවස්ථාවක් ලෙස ශක්තිමත් කරගැනීම, වරාය නගර ව්‍යාපෘති, එක් මාවතක්-එක් තීරයක් (One road - One belt) වැනි දේශීය හා විදේශීය සමුද්‍රීය ආර්ථික අවස්ථා සඳහා දේශීයව සූදානම් කරවීමේ විද්වත් යාන්ත්‍රණයක් ඇති කිරීම, ශ්‍රම බලකායේ එක් එක් ඛාණ්ඩ, සමුද්‍රීය ආර්ථිකය සඳහා මුසුකළ හැකි ආකාරය හඳුනාගැනීම සහ ලංකා නැව් සංස්ථාව ලෝකයේ නවීන නාවික පුහුණු ආයතනය බවට පත් කිරීම, සේවක බලඝණ දැනුමෙන් සහ කාර්යක්ෂමතාවයෙන් සන්නද්ධ කරමින් ශ්‍රී ලාංකේය නාවික සංස්කෘතියක් සඳහා පදනම සැකසීම, සමස්ත ශ්‍රී ලාංකේය වාණිජ නාවික ක්ෂේත්‍රයේ නාමාවලියක් සකස් කිරීම, සමුද්‍රීය බලශක්ති යාන්ත්‍රණය සඳහා ප්‍රවේශ වීම, ජාත්‍යන්තර නාවික නෛතික පරිපාටීන්, ගිවිසුම් ශ්‍රී ලංකාවට අදාල වන ආකාරය හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති ද්වි පාර්ශ්වීය, බහු පාර්ශ්වීය සහ ජාත්‍යන්තර ගිවිසුම් පසු විපරමට ලක් කිරීම, එමගින් ජනිත වන වාණිජ අවස්ථා හඳුනාගැනීම සඳහා ලංකා නැව් සංස්ථාව යටතේ කමිටුවක් ඇති කිරීම. එම අවස්ථා සඳහා උපදේශන ආයතනයක් ලෙස රාජ්‍ය සහ පුද්ගලික අංශයේ උපදෙස් ලබාදීම මේ යටතට ඇතුළත් වෙනවා. මේ තුළින් හෙට දවසේ ලංකා නැව් සංස්ථාවේ නව ජීවනයක් අපේක්ෂා කරනවා.

**නාවික ක්ෂේත්‍රයට නැවියන් පුහුණු කිරීම ඇතුළ**

සාමාන්‍යයෙන් බහුල ප්‍රවාහනය හා සම්බන්ධ නෞකා සහ සාම්ප්‍රදායික නැව් බඩු නෞකා කොළඹ සහ හම්බන්තොට වරායයන් වෙත පැමිණෙනවා. ඊට අමතරව සෙසු නෞකා ආකර්ෂණය කරගැනීමත් මෙහිදි වැදගත් වෙනවා. එහිදි නැව් වලට අවශ්‍ය තෙල් සම්පාදනය (Bunkering) කිරීමට අපිට පුළුවන්.

කාර්යභාරය රැසක් නැව් සංස්ථාවෙන් ඉෂ්ට කරනවා. අපි ඒ ගැනත් කතාකළොත්?

ඔව්. ඇත්තටම ලංකා නැව් සංස්ථාව සතුව මේ වනවිට නෞකා දෙකක් තියෙනවා. Lanka breeze සහ Lanka Princes නමින් 2016 වසරේ දී ය මේ නෞකා දෙක නැව් සංස්ථාවට හිමිවන්නේ. මේ නෞකාවේ විශේෂ කට්ටලයක් ස්ථාපිත කර තියෙනවා. නැවියන් ලෙස පුහුණු වන අපේ තරුණ පෙළට නාවික ක්ෂේත්‍රයට පිවිසෙන දරුවන්ගේ දිය මත පුහුණුව සඳහා එම විශේෂ තට්ටුව (Deck) භාවිත කරනවා. එක නැවක 28 දෙනෙකු වශයෙන් නැව් දෙකේ වසරකට මේ රටේ තරුණයින් 52 ක් සඳහා පුහුණුව ලබා දෙන්නට නැව් සංස්ථාව කටයුතු කරනවා.

**මෙහිදි පුහුණුකරුවන් ලබාදෙන්නේ කොහේද..?**

මොරටුව විශ්වවිද්‍යාලයේ සමුද්‍රීය කළමනාකරණය (Maritime Management) විෂය හදාරණ විද්‍යාර්ථීන් හට පළමු පුහුණුකාව ලබාදෙනවා. ඊට අමතරව කටුනායක ETI ආයතනය , මත්තක්කුලිල් මිහිත් ආයතනය , සිනමත් සමුද්‍රීය විශ්වවිද්‍යාලයේ අදාළ පාඨමාලාවලට සම්බන්ධ වන අයවලුන් හට අපි මෙම අවස්ථාව හිමි කරදෙනවා. මේ තුළින් අපේ ප්‍රධානතම අරමුණ අපේ රටට විදේශ විනිමය රැගෙන යන අවස්ථා විවිධාංග කිරීමයි.

**නාවික කේන්ද්‍රය සංකල්පය පිළිබඳ ඔබගේ තක්සේරුව කුමක්ද..?**

අපි ඇත්තටම වාසනාවන්ත ලෙස සිතියමේ අපි ඉන්නේ මැද තැනකයි. නැගෙනහිර හා බටහිර මධ්‍යයේ යි අපේ රට පිහිටා තියෙන්නේ. නැගෙනහිරට හා බටහිරට විහිදී ගිය නැව් මාර්ග සියල්ල ලංකාවට යටින් තියෙන්නේ. මෙන්න මේ තත්ත්වය ඉතාමත් හොඳ සාධනීය තත්ත්වයක්. මෙම පිහිටීමේ ශක්තාව මත පදනම්ව නාවික ක්ෂේත්‍රයක් කරා යාම ඉතාමත් පහසුයි. අපේ ව්‍යවහාරයේ තියෙනවා ලංකාව ළඟින් එක දිනකට නැව් 300-500 ක් අතර ප්‍රමාණයක් යාත්‍රා කරනවා කියා. මෙන්න මේ නැව් අපේ රටට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම වැදගත්. මූලික වශයෙන් නැව් වලට අවශ්‍ය වන්නේ මොනවාද ? අපි ඒවා සපුරාලිය යුත්තේ කෙසේද ? කියන කාරණය අපි අතරේ තියෙනවා.

සාමාන්‍යයෙන් බහුල ප්‍රවාහනය හා සම්බන්ධ නෞකා සහ සාම්ප්‍රදායික නැව් බඩු නෞකා කොළඹ සහ හම්බන්තොට වරායයන් වෙත පැමිණෙනවා. ඊට අමතරව සෙසු නෞකා ආකර්ෂණය කරගැනීමත් මෙහිදි වැදගත් වෙනවා. එහිදි නැව්වලට අවශ්‍ය තෙල් සම්පාදනය (Bunkering) කිරීමට අපිට පුළුවන්. නැව්වලට අවශ්‍ය තෙල් තරගකාරී මිලකට ලබාදීමට මේ පිළිබඳ මම සොයා බැලූ කරුණු වලට අනුව සිංගප්පූරුවේ සමුද්‍රීය අධිකාරියේ මෙට්‍රික් ටොන් මිලියන 62 ක් අලෙවි කර තියෙනවා. ඒ අනුව අපිට පැමිණි නැව් සංඛ්‍යාව ඉතාම අඩුයි. එහිදි අපි සොයා බලන්න ඕනෑ නැව් සංඛ්‍යාව වැඩි කරගන්නේ කෙසේද කියා. අපිට Offshore bunkering වෙත යොමු වීමට කාලය එළඹ තියෙනවා. ඒ සඳහා Floting bunker burgers යොදාගැනීමෙන් ඒ තරණ නැව් වලට ඉන්ධන ලබාදීමේ කටයුතු සිදුකරන්න පුළුවන්.

මම දකින අනිත් කාරණය තමයි නැව් අලුත්වැඩියාව සහ නැව් නිෂ්පාදනයටත් අපි පිවිසිය යුතුයි. රට වටේම මුහුද තියෙන අපිට එය අපහසුවක් නොවේ. අපි සතු නැව් දෙකේ අලුත්වැඩියා කටයුතු සඳහාත් අපිට වොක්ස්ඩ් ආයතනයේ පෝලිමේ බලා ඉන්න සිදු වී තියෙනවා. ප්‍රධාන වශයෙන් නැවියන් පුහුණු කිරීමේ කටයුතු වලට අපි ප්‍රමුඛතාව ලබාදෙන්නේත් මේ අරමුණෙන්. විදේශයන්ගෙන් ඩොලර් උපයාගැනීමට නැවියන්ගෙන් විශිෂ්ට ආයතනයක් සිදුවෙනවා.

නැව් සංස්ථාව ලෙසින් අපගේ අමාත්‍යාංශයට අපි මේ වනවිට යෝජනා කර තියෙනවා, ශ්‍රී ලංකා ධජය ප්‍රවර්ධනය කිරීම සඳහා නැව් ලියාපදිංචි කිරීමට. එය වෙළඳ හා නාවික කාර්යාලය සමඟ එකතුව කිරීමට බලාපොරොත්තු වෙනවා. දැනටත් මේ නැව් ලියාපදිංචි කර ඇත්තේ 60 ක් පමණයි. එයිනුත් විශාලම නැව් 02 වන්නේ නැව් සංස්ථාවට අයත් සිලෝන් ප්‍රින්සස් සහ සිලෝන් බ්‍රීස් නෞකාවන්. ඇත්තටම අපි නැව් ලියාපදිංචියක් සිදුකරා නම් අපිත් එක්ක තවත් නැව් සමාගම් සම්බන්ධ වෙනවා. ඒ නැව් වලට අපිට පුළුවන් කොන්දේසි පනවන්න යම් යම් සේවාවන් ලබාදීම තුළින්. ඒ තුළින් ශ්‍රී ලංකා රජයට මුදල් සම්පාදනයට අවකාශය සැලසිය හැකියි.

**අපි බොහෝ වෙලාවට අපගේ සේවාවන් ජාත්‍යන්තර වෙළඳපොළට ගැලපෙන ලෙසින් යොමු කර නැහැ..?**

ඔව්, එහි සත්‍යතාවයක් තියෙනවා. අපගේ සේවාවන් ජාත්‍යන්තර වෙළඳ පොළට ගැලපෙන ලෙසින් වෙනස් විය යුතුමයි. අප නැවියන් පුහුණු කිරීමේ කාර්ය සිදුකරන්නේ මෙන්න මේ කාරණාවන් කේන්ද්‍ර කරගනිමින්. නාවික ක්ෂේත්‍රය තුළ මෙතෙක් ස්පර්ශ කර නොමැති ව්‍යාපාරික අවස්ථා නිසි ආකාරයෙන් හඳුනාගනිමින් හෙට දවසට ගැලපෙන නව ප්‍රමෝපායයන් සමඟ කටයුතු කිරීමට අපි නම්‍යශීලී විය යුතුයි. මේ සඳහා හොඳම උදාහරණය තමයි සිංගප්පූරුව.

**අපි ස්ථානීය වශයෙන් හොඳම තැනක සිටින්නේ. එය ප්‍රශස්ත ලෙසින් භාවිත කිරීමට ඔබගේ යෝජනා කවරේද..?**

නාවික ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සපිරි විද්වත් පිරිස ඒකරාශී කිරීම ඉතා වැදගත්. ඔවුන් ඒකතු කර කමිටුවක් පත්කර අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා අපේ විෂයභාර අමාත්‍යතුමාගේ මගපෙන්වීම යටතේ ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයි. ඒ ඔස්සේ නාවික කේන්ද්‍රයක් කරා යන ගමනට අවැසි ශක්තිය හා එය කෙසේ සම්පාදනය කළ යුතුද යන්න පිළිබඳ සැලකිලිමත් විය යුතුයි.

**නැවියෙක් ලෙසින් ක්ෂේත්‍රයට පිවිසෙන තරුණයෙකු සපුරාලිය යුතු සුදුසුකම් මොනවාද..?**

ඇත්තටම අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශේෂයෙන් උසස් පෙළ විෂය ධාරාවේ ඒ සඳහා කිසිදු යොමු කිරීමක් නැහැ. උසස් පෙළ ප්‍රතිඵල වලින්ම ඒ සඳහා යොමු වීමේ ක්‍රමවේදයක් සකස් විය යුතුයි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් පුළුල් මැදිහත්වීමක් මේ සඳහා අවශ්‍යයි.

දැන් බලන්න අපේ ගෘහ සේවිකාවන් මැද පෙරදිග ඇතුළු විවිධ රටවල සේවයට ගොස් මේ රටට ගෙනෙන විදේශ විනිමය ඉතාම අල්පයි. නමුත් නාවික ක්ෂේත්‍රයේ ප්‍රවීණයක්, පළපුරුද්දෙකුගෙන් පුහුණු කිරීම තුළින් අපිට අපේ රටට විශාල විදේශ විනිමයක් උපයා ගත හැකියි. නැවක කපිතාන්වරයෙක් සාමාන්‍යයෙන් ඇමරිකන් ඩොලර් 12000 ක වගේ වැටුපක් ලබනවා. නෞකාවක සාමාන්‍ය සේවකයෙකුත් ඩොලර් 750 ක වැනි වැටුපක් ලබනවා. ඉතින් අපිට මේ නාවික ක්ෂේත්‍රය තුළින් මේ රටේ මානව සම්පතට රැකියා වෘත්තීයට, පුහුණු සේවා නියුක්තියට නව ඉරණමක් දිය හැකියි කියා මම විශ්වාස කරනවා. ඒ සඳහා හොඳම විසඳුමක් ලෙස අපේ රටේ නැවියන් බිහිකිරීමේ කටයුත්ත මෙ දකිනවා. නැව් සංස්ථාවේ අපේ ප්‍රධාන කාර්යභාරයක් ලෙසින් අපි එය වගකීමෙන් ඉටුකරනවා.

**හොරොව්පොතාන බලාගාරයට අවශ්‍ය ගල් අඟුරු ප්‍රවාහනයේ ප්‍රධාන වගකීමත් ඔබ ආයතනය සතුයි ?**

ඔව්, නොරොච්චෝලේ බලාගාරයට වාර්ෂිකව ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2-4 ක පමණ ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. සිලෝන් බ්‍රීස්, සිලෝන් ප්‍රින්සස් නෞකාවල මූලිකත්වයෙන් එය සිදුකරනවා.

29 පිටුවට

17 පිටුවෙන් 

**පසුගිය දිනක නැව් සංස්ථාව වසර 50 ක සිය අභිමානය සමරනු ලැබුවා..?**

1971 ජුනි මස 06 වැනි දින ආරම්භ කරන ලද ලංකා නැව් සංස්ථාව ස්ථාපිත කිරීමේ ගෞරවය හිමිවන්නේ එවකට ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වෙතයි. 1970-1977 සමයේ එතුමියගේ නායකත්වයෙන් රාජ්‍ය ව්‍යවසාය යාන්ත්‍රණයක් නිර්මාණය කළා. නැව් සංස්ථාව කියන්නෙත් එවැනි එක් ප්‍රමුඛ රාජ්‍ය යාන්ත්‍රණයක්. ශ්‍රී/ස ලංකා නැව් සංස්ථා පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් අවශ්‍ය මූලික නෛතික පදනම ස්ථාපිත කළ වරාය හා සංචාරක අමාත්‍ය පී.බී.සී. කලුගල්ල මහතා ද එවකට අමාත්‍යංශ ලේකම් ධූරය දරමින් නැව් සංස්ථාවේ සමාරම්භක සභාපතිධූරය දරන ලද පී.බී.කරුදවල මහතාවත් මම මේ මොහොතේ ගෞරවයෙන් සිහිපත් කරනවා. පසුකාලීනව නැව් සංස්ථාවේ මව්පිය අමාත්‍යංශය වූ වරාය විෂය භාර අමාත්‍යවරුන් ද, විශේෂයෙන් ම ලලිත් ඇතුලත්මුදලි මහතා ද සංස්ථාවේ සභාපතිධූරය හෙබ වූ සියලු දෙනාවද, අපේ ආයතනයේ උන්නතිය වෙනුවෙන් ඈත දියඹේ මාස ගණනක් ගතකරමින් සහ බුද්ධිය, ශ්‍රමය එදා මෙදා තුර කැප කළ, කැපකරන සියලුම සේවක කැලත් මේ මොහොතේ ගෞරවයෙන් සිහිපත් කරනවා.

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ ධූර හෙබ වූ ඔබ අද නැව් සංස්ථාවේ සභාපති. නාවික ක්ෂේත්‍රය නම් වූ හුයකින් ඔබ බැඳී සිටිනවා. කෙසේද ඔබතුමාට එය දැනෙන්නේ ?**

ඔව්, ඇත්තටම මේ ආයතන දෙකම එකට බද්ධ වී තිබෙන්නේ. නැව් ක්ෂේත්‍රය ගත්තොත් විසල් ඉසව් රැසක් සමගින් පැතිරී විසිරී තිබෙන ක්ෂේත්‍රයක්. වරායයන් සමග සම්බන්ධව සේවා රැසක් ලබාදෙන සුවිශේෂී ආයතනයක් විදියට නැව් සංස්ථාව මම හඳුනාගන්නවා.

**ලංකා නැව් සංස්ථාව ලෙසින් සමුද්‍රීය කලාපයේ සෙසු රටවල නැව් සංස්ථා සමගින් පවතින සම්බන්ධතාවය කෙසේද ?**

හොඳ සහසම්බන්ධතාවක් අපි කලාපයේ නැව් සංස්ථා සමග ගොඩනගාගෙන යමින් සිටිනවා. බංගලාදේශයේ නැව් සංස්ථාව අපිට යෝජනා කරනවා ප්‍රමුඛතා නැංගුරම්ලෑමේ පහසුකම් ලබාදෙන්න කියා. නමුත් බංගලාදේශ නැව් සංස්ථාව සතුව වරායක් තිබෙනවා. අපි මේ පිළිබඳ දැනුවත් කිරීම සිදුකර තිබෙනවා. මෙහිදී මං මේ පිළිබඳ වරාය අධිකාරියේ උසස් නිලධාරීන් සමග සාකච්ඡා කර ප්‍රමුඛතා නැංගුරම් පහසුකම් වෙනුවට සාධාරණ කොටා නැංගුරම් පහසුකම් ලබාදීමට එකඟතාවය ලබාගැනීමට හැකි වී තිබෙනවා.

**නොරොච්චෝලේ බලාගාරය ආශ්‍රිතව රුවල් යාත්‍රා නැංගුරම්ලන කලාපයක් ඉදිකිරීම යථාර්ථයක් බවට පත්වන්නේ කෙසේද ?**

ඇත්තටම නොරොච්චෝලේ බලාගාරයේ ගල් අඟුරු සැපයීම් කටයුතු ආශ්‍රිතව අපි ඒ ප්‍රදේශයේ නිවාස ලබාගෙන සේවකයින් රැඳී සිටිනවා. ඊට අමතරව මීට අදාළ ක්ෂේත්‍රයන්ගේ නිලධාරීන් 100 කට අධික ප්‍රමාණයක් නිරන්තරයෙන් එම ප්‍රදේශයේ නේවාසිකව මෙම කටයුත්තට උරදෙනවා. ප්‍රථමයෙන් මෙම පිරිස ඉලක්ක ගත කරගෙන මේ වනවිට මුහුද ආශ්‍රිතව අක්කර 10 ක පමණ භූමියක් තෝරාගෙන තිබෙනවා. නොරොච්චෝලේ ප්‍රාදේශීය ලේකම් සමග සාකච්ඡා කර එම භූමිය දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගෙන කටයුතු කරනවා.

ඉන් අනතුරුව රුවල් යාත්‍රා සම්බන්ධයෙන් කටයුතු කරන සේල් ලංකා ආයතනය (Sail Lanka) සමග ගිවිසුම්ගතව මෙම ස්ථානයේ රුවල් යාත්‍රා කලාපයේ ස්ථාපිත කිරීමට කටයුතු කරනවා.

**හෙට දවසේ නැව් සංස්ථාවේ අභිලාෂයන් මොනවාද ?**

මගේ මූලික අභිප්‍රාය නැව් සංස්ථාව තුළින් මේ රටට විදේශ විනිමය විශාල වශයෙන් රැගෙන ඒමයි. ජාත්‍යන්තර නාවික ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයට සරිලන ලෙසින් සේවා පහසුකම් සැලසීමට කටයුතු කරනවා.

ඒ වගේම අපි ගල් අඟුරු ප්‍රවාහනය තුළින් ඇ.ඩො. බිලියන 11 ක් වැනි ප්‍රමාණයක් මේ රටින් විදේශගතව යැවීම නවත්වා තිබෙනවා. නව නැව් කිහිපයක් මිලදීගෙන මෙම තත්ත්වය වඩාත් යහපත් තැනකට රැගෙන ඒමට බලාපොරොත්තු වෙනවා.